# පිදුරංගල ආකර්ෂිතය සංචාරක ආකර්ෂිතයක් ලෙස සැලසුම් කිරීම

බී.ජී.ගිම්හානි මිල්හාරා, ඩබ්.ඒ.පියුමි වීරක්කොඩි, එන්.නිදුෂාණි ගොඩමුල්ල*

පිදුරංගල විහාරය ශ්‍රී ලංකාවේ මාතලේ දිස්ත්‍රික්කයේ දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ‘සීගිරිය’ ග්‍රාමය ආශ්‍රිතව පිහිටා ඇත. මෙය මුහුදු මට්ටමේ සිට මීටර 340 ක් පමණ උස් වූ කන්දක ඉදි කරනු ලැබූ ඓතිහාසික බෞද්ධ පුදබිමක් වේ. සීගිරි පර්වතයට උතුරු දෙසින් වූ මෙම පිදුරංගල ආකර්ෂිතය මනස්කාන්ත ස්වාභාවික පරිසරයකි.

මෙම අධ්‍යයනයේ මූලික පරමාර්ථය වූයේ විවිධත්වයෙන් යුතු සංචාරක සංකල්පයන් ගණනාවක් ක්‍රියාත්මක කළහැකි ස්ථානයක් ලෙස පිදුරංගල ආකර්ෂිතය ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයට සක්‍රීය දායකත්වයක් සපයන ස්ථානයක් ලෙස සැලසුම් කිරීම වේ. මෙම අධ්‍යයනයේ අරමුණු සාධනය කිරීම සඳහා පිදුරංගල පිළිබඳව ලිඛිත මූලාශ්‍රය අධ්‍යනය, පූර්ව පර්යේෂණ වාර්තා අධ්‍යයනය, ක්ෂේත්‍රගත අධ්‍යයන හා සම්මුඛ සාකච්ඡා ඇසුරින් සැලසුම් කළ යුතු ආකාරය පිළිබඳව අධ්‍යනය කරනු ලැබිණි. එමෙන්ම මෙම ස්ථානයට පැමිණෙන සංචාරකයන්ට ප්‍රශ්නාවලියක් ලබා දීම මගින් ද මෙහි වර්තමාන තත්ත්වය පිළිබඳව අධ්‍යනය කරනු ලැබිණි.

මෙහිදී සැලසුම්ගත සංචාරක ආකර්ශිතයක පැවතිය යුතු අනිවාර්යය අංගයන් වන ළඟා වීමේ පහසුව , නවාතැන් පහසුකම්, සංචාරක ආකර්ෂණ, සංචාරක ක්‍රියාකාරකම් හා වෙනත් පහසුකම් ආදිය පිදුරංගල ආශ්‍රිතව ප්‍රමාණවත් අයුරින් ක්‍රියාත්මක නොවන බව හඳුනාගනු ලැබිණි. සංචාරක ආකර්ෂිතයක මෙවැනි අංග පැවතීම අත්‍යවශ්‍ය වූවකි. එබැවින් පවතින දුර්වලතා මගහරවා ගනිමින් මෙම ආකර්ෂිතය සාර්ථක සංචාරක සැලසුමක් ක්‍රියාත්මක වන, සැලසුම් සහගත සංචාරක ආකර්ෂිතයක් බවට පත් කිරීම සඳහා අවශ්‍ය පියවරයන් හඳුනා ගැනුණි.

ප්‍රමුඛ පද : පිදුරංගල, සංචාරක ආකර්ෂිතය, සැලසුම් කිරීම, මාතලේ දිස්ත්‍රික්කය, සංචාරකයා

* පුරාවිද්‍යා අධ්‍යන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය gimhanimilhara @ gmail.com/ piyumi220@ gmail.com/ nidushanidd@ gmail.com